# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 SLSI
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/FIN-AP/03/FI/06(B) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2024.08.05 |

## මූල්‍ය චක්‍රලේඛ 09/2024

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.),
බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.

**ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය සඳහා වන අතිරේක අංක 40 බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම**

ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය සහ මාර්ගෝපදේශ සංග්‍රහය සංශෝධනය කරමින් 2024.06.25 දිනැතිව නිකුත් කරන ලද අතිරේක අංක 40 සංශෝධන සහිතව බස්නාහිර පළාතට අදාල කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

02. එමෙන්ම මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන **2024.07.24** දින සිට වලංගු වන අතර ඒ අනුව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

03. ඒ අනුව මේ සම්බන්ධයෙන් 2022.06.28 දිනැතිව නිකුත් කරන ලද **"ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය සඳහා වන අතිරේක අංක 35 සහ 38 බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම "** යන මැයෙන් වන මූල්‍ය චක්‍රලේඛ අංක 10/2022 මෙයින් අවලංගු වේ.

..............................
එස්.එල්. ධම්මිකා කේ. විජයසිංහ
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

දුරකතන : 0112-093416
ෆැක්ස් : 0112-092636
විද්‍යුත් ලිපිනය : accpay@cs.wpc.gov.lk

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.

## 01.කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා අධිකාරී සීමාවන්

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යොමුව : 2.14.1

**කොන්ත්‍රාත් පිරිනැමීම නිර්දේශ/නිර්ණය කිරීම සඳහා**
**ප්‍රසම්පාදන කමිටුවල අධිකාරී සීමාවන්**

විවෘත තරඟකාරී ලංසු කැඳවීමේ පටිපාටිය (මාර්ගෝපදේශ සංග්‍රහය 3.1, 3.2 හෝ 3.3) හෝ සෘජු කොන්ත්‍රාත්කරණය (මාර්ගෝපදේශ සංග්‍රහය 3.5 හෝ 3.6) පටිපාටිය අනුගමනය කිරීමේදී

1. ප්‍රසම්පාදන අධිකාරය තීරණය කිරීමේදී එක් එක් ප්‍රසම්පාදනය සඳහා වන මුළු පිරිවැය ඇස්තමේන්තුව සැලකිල්ලට ගත යුතුය.

2. කුලියට දීම් සහ බදු දීම් සම්බන්ධයෙන් සම්පූර්ණ කුලී හෝ බදු කාල සීමාව සඳහා කොන්ත්‍රාත්තුවේ වටිනාකම, ප්‍රසම්පාදන අධිකාරය තීරණය කිරීමේදී සැලකිල්ලට ගත යුතුය.

(රු.මිලියන)

| බල අධිකාරය | පළාත් අරමුදල් වලින් කරන කොන්ත්‍රාත්තු | විදේශ අරමුදල්වලින් කරන කොන්ත්‍රාත්තු |
|---|---|---|
| වැඩ, භාණ්ඩ හා සේවා සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලය පත් කල ප්‍රසම්පාදන කමිටුව * | **750 ට වැඩි** | **1500 ට වැඩි** |
| වැඩ, භාණ්ඩ හා සේවා සඳහා ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව | **750 දක්වා** | **1500 දක්වා** |
| වැඩ, භාණ්ඩ හා සේවා සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | **500 දක්වා** | **800 දක්වා** |
| වැඩ, භාණ්ඩ හා සේවා සඳහා දෙපාර්තමේන්තු /අධිකාරී ප්‍රසම්පාදන කමිටුව් | **250 දක්වා** | **400 දක්වා** |
| වැඩ, භාණ්ඩ හා සේවා සඳහා ප්‍රාදේශීය/අධිකාරී ප්‍රසම්පාදන කමිටුව | **50දක්වා** | **100 දක්වා** |

* පළාත් අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටුව පළාත් අමාත්‍ය මණ්ඩලයට නිර්දේශය කරනු ලබන අතර තීරණය පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබනු ඇත.

## 02. වෙළඳපල මිල සැදහුම් ක්‍රමයේදී (මාර්ගෝපදේශ 3.4) පිළිපැදිය යුතු ක්‍රියා පටිපාටිය.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යොමුව: 2.14.1

### වෙළඳපල මිල සැදහුම් ක්‍රමයේදී (මාර්ගෝපදේශ 3.4) පිළිපැදිය යුතු ක්‍රියා පටිපාටිය.

01. සැපයුම් හා සේවා කොන්ත්‍රාත්තු සඳහා මිල ගණන් පහත සඳහන් අය වෙතින් ඉල්ලුම් කල හැකිය.

    I. දුරකථන නාමාවලියෙහි අඩංගු, ශ්‍රී ලංකා ටෙලිකොම් රේන්බෝ පිටු වල ප්‍රකට වෙළඳුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලැයිස්තුගත කර ඇත්නම් එම සැපයුම්කරුවන් වෙතින්:

    II. ප්‍රසම්පාදන අස්ථිත්වය සමඟ ලියාපදිංචි සැපයුම්කරුවන්: (අදාල වේ නම්)

02. ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා මිල ගණන් ප්‍රජාපාදක සංවිධාන (ප්‍ර.පා.ස.)ඇතුලත්ව ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විසින් කැඳවිය හැකිය.

    අදාල අවස්ථාවන්වල ප්‍රසම්පාදන අස්ථිත්වයන් විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සකසන ලද සම්මත ලිපි ලේඛණ භාවිතා කල යුතුය. එසේමකලින් දැනුම් දුන් දිනක ලංසු භාර ගැනීම අවසන් කල යුතු අතර එම ලංසු ප්‍රසිද්ධියේ විවෘත කල යුතුය.

| | | පළාත් අරමුදල් යොදවනු ලබන කොන්ත්‍රාත්තු | විදේශ අරමුදල් යොදවනු ලබන කොන්ත්‍රාත්තු |
|---|---|---|---|
| ප්‍රධාන ලේඛම් ප්‍රසම්පාදන කමිටුව | වැඩ- මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන්. | රු.මිලියන 40 දක්වා | රු.මිලියන 40 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා- මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන්. | රු.මිලියන 25 දක්වා | රු.මිලියන 25 දක්වා |
| අමාත්‍යාංශ/තියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ප්‍රසම්පාදන කමිටුව | වැඩ- මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන්. | රු.මිලියන 30 දක්වා | රු.මිලියන30 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා- මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන්. | රු.මිලියන 20 දක්වා | රු.මිලියන 20 දක්වා |
| දෙපාර්තමේන්තු /ගොඩනැගිලි අධ්‍යක්ෂ ප්‍රසම්පාදන | වැඩ- මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන්. | රු: මිලියන 15 දක්වා | රු: මිලියන 10 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා- මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන්. | රු: මිලියන 15 දක්වා | රු: මිලියන 10 දක්වා |

| | | | |
|---|---|---|---|
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | වැඩ-<br>මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන්. | රු: මිලියන 05 දක්වා | රු: මිලියන 05 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා-<br>මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන්. | රු: මිලියන 02 දක්වා | රු: මිලියන 02 දක්වා |
| ප්‍රධාන ගණන්දීමේ* නිලධාරී/ගණන්දීමේ නිලධාරී | වැඩ-<br>මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන්. | රු: මිලියන 02 දක්වා | |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා-<br>මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන්. | රු: මිලියන 1 දක්වා | |

ඇමුණුම් අංක 03

## 03. වෙළඳපොල මිල සැදහුම් ක්‍රමයේදී යොදා ගන්නා සෘජු මිලදී ගැනීම්-සුළු වටිනාකම් සහිත අලුත්වැඩියා වැඩ, භාණ්ඩ හා සේවා.

<table>
<tr><th colspan="3">සෘජු මිලදී ගැනීම්- සුළු වටිනාකම් සහිත අලුත්වැඩියා වැඩ, භාණ්ඩ සහ සේවා<br>(විදේශ අරමුදල් යෙදවුම් හෝ ශ්‍රී ලංකා රජයේ අරමුදල් යෙදවුම්)</th></tr>
<tr><td colspan="3">සෘජු මිලදී ගැනීම්-සුළු වටිනාකම් සහිත අලුත්වැඩියා වැඩ, භාණ්ඩ හා සේවා (මාර්ගෝපදේශ අංක 3.5 සහ 3.6)</td></tr>
<tr><th>අධිකාරිය</th><th>සම්පූර්ණ කල යුතු කරුණු</th><th>අධිකාරි සීමාව</th></tr>
<tr><td rowspan="3">ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/<br>දෙපාර්තමේන්තු ප්‍රධානි</td><td>වැඩ -<br>• මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 හෝ 3.6 හි අඩංගු අවශ්‍යතාවයන් සපුරාලීමෙන්.</td><td>රු: 600,000 දක්වා</td></tr>
<tr><td>භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා-<br>• මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 හෝ 3.6 හි අඩංගු අවශ්‍යතාවයන් සපුරාලීමෙන්.</td><td>රු: 300,000 දක්වා</td></tr>
<tr><td>වැඩ-<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුම්දායී නොවන විට.<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව ප්‍ර.ග.නි/දෙ.ප්‍ර සහතික විය යුතුය.<br>• මෙම අධිකාරය ප්‍ර.ග.නි/දෙ.ප්‍ර ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කල යුතු අතර වෙනත් පුද්ගලයකු වෙත නොපැවරිය යුතුය.</td><td>රු: 300,000 දක්වා</td></tr>
<tr><td>ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/<br>දෙපාර්තමේන්තු ප්‍රධානි</td><td>සෘජුවම වෙළඳපොලෙන් භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය-<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුම්දායී නොවන විට.<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව ප්‍ර.ග.නි/දෙ.ප්‍ර සහතික විය යුතුය.<br>• මෙම අධිකාරය ප්‍ර.ග.නි/දෙ.ප්‍ර ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කල යුතු අතර වෙනත් පුද්ගලයකු වෙත නොපැවරිය යුතුය.</td><td>රු: 150,000 දක්වා</td></tr>
</table>

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තු ප්‍රධානි | මෝටර්රථ සහ වෙනත් උපකරණ අලුත්වැඩියාව-.<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුම්දායී නොවන විට.<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව දෙ.ප්‍ර සහතික විය යුතුය.<br>• මෙම අධිකාරය දෙ.ප්‍ර ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කල යුතුය.<br>• රුපියල් 500,000/- ඉක්මවන අලුත්වැඩියාවන් සඳහා ප්‍ර.ග.නි.ගේ පෞද්ගලික අනුමැතිය ලබා ගත යුතුය. | රු: 500,000 දක්වා |
| දෙ.ප්‍ර.විසින් අධිකාරි බලය පවරන ලද ප්‍රාදේශිය ප්‍රධානීන් හෝ අදාල ඒකක භාර/අංශ භාරව කටයුතු කරන ප්‍රධානීන් | එක් දිනකදී එක් කටයුත්තක් සඳහා රුපියල් **20,000/-** ක් නොඉක්මවන පරිදි සුළු වටිනාකම් සහිත උපකරණ ඇතුළුව භාණ්ඩ හා සේවාවන් මිලදී ගැනීම -<br>• එක් ලිත් මාසයක් තුල සිදු කරනු ලබන එබඳු මිලදී ගැනීම්වල එකතුව රුපියල් 100,000/- නොඉක්මවිය යුතුය. | රු: 20,000 දක්වා |
| | මසකට රු.100,000 නොයික්මවන මෝටර් වාහන අලුත්වැඩියා කිරීම. | රු: 100,000 දක්වා |

## 04. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යොමුව 9.3.1

### මෝටර් වාහන සහ උපකරණ අලුත්වැඩියා කිරීම.

අලුත්වැඩියා කිරීමේ ආර්ථික වාසිය, වාහනයේ වයස සහ තත්වය සැලකිල්ලට ගෙන, ඉදිරිපත් කර ඇති මිල ගණන් සාධාරණ බවට ප්‍රසම්පාදන අස්ථිත්වය සෑහීමකට පත්වන්නේ නම් නිෂ්පාදකයන්ගේ බලය ලත් දේශීය නියෝජිතයින් හරහා මෝටර් වාහන වලට සහ වෙනත් උපකරණ වලට අලුත්වැඩියා කිරීම් සිදු කල හැකිය.

ප්‍රසම්පාදන අත්පොතෙහි සඳහන් කර ඇති පරිදි, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අධිකාරය පැවරීමක් කල හැකිය.එසේ වුවද රුපියල් ලක්ෂ පහකට (රු.500,000) වැඩි නම් අලුත්වැඩියා කිරීම් සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගත යුතුය.